

# කොඩියගෙ ළමා

ලක්ෂමන් කොඩිතුවක්කු

# මළ ජූලිය

ජූලි මාසය අපට අමතක කළ නොහැක්කේ ඇයි?, එය මහමෙරක් සේ දුක් කම්කටොළු කන්දක බර අපට ඉතිරිකර ගිය මාසයකි. අද ජීවත්වන තරුණ පරම්පරාවට, නවීන තාක්ෂණික තොරතුරු මාධ්‍ය ජාලා ඔස්සේ එම අතීතය කියවා රූප රාමු පමණක් දැක බලාගත හැකි වුවත්, අප නම් එම අඳුරු යුගය දෑසින්ම දුටු, එම අත්දැකීම් ලැබූ පරම්පරාවකි. ඒ ගැන මතකය ඇති බොහෝ දෙනෙක් අදටත් ජූලි මාසයට බියක් දක්වති. ජූලි මාසය අප රටේ ඛේදජනක අවාසනාවන්ත මාසය ලෙස ඔවුහු සිතති.

අදවනවිට අසූවේ ජූලි වැඩ වර්ජනයට අවුරුදු තිස් අටකි. කළු ජූලියට වසර තිස් පහකි. එකල අප තරුණයන් ලෙසින් අතීතයේ දෑසින් දුටු බොහෝ දෑ අදත් මතකයේ පවතී.

එවකට පැවති රජය අසූවේ ජූලි වැඩ වර්ජනය මර්දනය කළේ බොහෝ කුරිරු අන්දමිනි. රජයේ කුලී හමුදා හා නිල නොලත් මැර ප්‍රහාර වලින් වර්ජකයන් මර්ධනය කළ රජය, අවසානයේ නැවතුණේ වර්ජකයන් සියල්ල තම රැකියා වලින් නෙරපා දමමිනි. පාලකයන්ට හිතැති බො හෝ දෙනෙකුට රැකියා ලැබුණද, විරුද්ධ පාක්ෂික වෘත්තීය සමිති සාමාජිකයන් බොහෝ දෙනෙකු රැකියා වලින් නෙරපා දැමිණි. එවැනි පළිගැනීම් වලට මුහුණ දුන් අප අතර සිටි ඥාති හිත මිත්‍රාදීන් අතර සිටි එක් පුද්ගලයෙකු මුහුණ දුන් ඛේදවා චකයක් පිළිබඳව මගේ මතකය හා තවමත් රැඳී තිබේ.

ඔහු අපට ඈතින් ඥාති සම්බන්ධතාවයක් අති ජිනසේන මාමාය. ජිනසේන රැකියාව කළේ රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ කාර්යාල කාර්ය සහායකවරයෙකු ලෙසිනි. වාමාංශික වෘත්තීය සමිතියකට සම්බන්ධව සිටියද ඔහු දේශපාලනය ගැන එතරම් දැනුමක් නොතිබූ අසාධාරණයට පමණක් එරෙහිවන සංවේදී පුද්ගලයෙකු විය. මුළු රටේම වැඩ වර්ජනය දියත් කළ මොහො තේ, තමන්ගේ හිත මිතුරු සේවකයන් සමඟ ඔහුද වැඩ වර්ජනයට හවුල් විය. මෙහි වැදගත්ම කාරණය වන්නේ මොහු වාමාංශික වෘත්තීය සමිතියක් සමඟ සිටියද, එවකට පැවති ජයවර්ධන රජය බලයට පත්කිරීමට කතිරය ගැසූ ගමම දන්නා එජාප පාක්ෂිකයෙකු වීමයි.

වැඩ වර්ජනය නිසා ඔහුට රැකියාව අහිමි විය. එහෙත් ඔහු නැවත රැකියාව ලබා ගැනීමට දේශපාලඥයන් පසු පස නොගියේය. රැකියාව අහිමි වූ මුල් කාලයේ ඔහුට අහළ පහළ හිත මිතුරන් හා ඥාති මිතුරන් උදව් උපකාර කළහ. පාසල් යන වයසේ දියණියන් තිදෙනෙකුගේ පියෙකු වූ



